# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1873/16 - 2014 ජූලි මස 30 වැනි බදාදා - 2014.07.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. බී. 21/78(XIII).

**1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනත**

1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 18 වන වගන්තිය සමග කියවිය යුතු 140 වන වගන්තිය යටතේ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සාදනු ලබන නියමාවලිය.

ලේකම්,
විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව.

2014 ජූලි මස 30 වැනි දින,
කොළඹ දී ය.

නියමාවලිය

1. මේ නියමාවලිය 2014 අංක 2 දරන වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතන (සංශෝධන) නියමාවලිය යනුවෙන් හඳුන්වනු ලබන අතර එය ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් පසු බලාත්මක වන්නේ ය.

2. 2003 දෙසැම්බර් මස 3 වැනි දින අංක 1317/17 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද නියමාවලිය මගින් අවසන් වරට සංශෝධිත, 1980 අප්‍රේල් මස 10 වැනි දින අංක 83/7 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 1980 අංක 1 දරන වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතන නියමාවලිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ. :-

(1) 6 වන ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් ׃

"6. ආයතනයේ නිලධරයන් පහත දැක්වෙන පරිදි විය යුතු ය.

(අ) අධ්‍යක්ෂවරයා ;
(ආ) නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා ; සහ
(ඇ) වෙනත් යම් තනතුරක් දරන තැනැත්තකු මේ ඡේදයෙහි කාර්යය සඳහා නිලධරයකු බව නියමාවලි මගින් ප්‍රකාශ කරනු ලැබ ඇත්තේ ද එකී තනතුරක් දරනු ලබන තැනැත්තා."

(2) එහි 7 වන ඡේදයේ

(i) (6) වන සහ (7) ඡේද ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් ׃

"(6) නිවාඩු පිට සිටීම, රෝගාතුරවීම, ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ වෙනත් යම් හේතුවක් නිසා ස්වකීය ධුරයේ කටයුතු ඉටු කිරීමට අධ්‍යක්ෂවරයා තාවකාලිකව අපොහොසත් වන අවස්ථාවක දී නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා විසින් ඒ කාර්යයන් ඉටු කළ යුතු ය. අධ්‍යක්ෂවරයා සහ නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා යන දෙදෙනාම නොපැමිණෙන අවස්ථාවක දී, එම නොපැමිණීම සිදු වී දින හතක් ඇතුළත කොමිෂන් සභාව විසින් අධ්‍යක්ෂ ධුරයේ කාර්යන් ඉටු කිරීම සඳහා කොමිෂන් සභාව විසින් සුදුසු යැයි සලකනු ලබන යම් වැඩ පිළිවෙළක් සකස් කළ යුතු ය. එම වැඩ පිළිවෙල සකස් කරනු ලබන තෙක් විශ්වවිද්‍යාල ලේඛකාධිකාරීවරයා විසින් එම ධුරයේ එදිනෙදා කටයුතු කරගෙන යා යුතු ය.

(7) අධ්‍යක්ෂ ධුරයේ යම් පුරප්පාඩුවක් ඇති වූ අවස්ථාවක දී, මේ ඡේදයේ ඉහතින්ම වූ විධිවිධාන යටතේ ස්ථිර පත්කිරීමක් සිදුකරනු ලබන තෙක්, නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා විසින්, අධ්‍යක්ෂ ධුරයේ කාර්යයන් ඉටු කරනු ලැබිය යුතු ය. නියෝජ්‍ය අධ්‍යක්ෂවරයාට අධ්‍යක්ෂ ධුරයේ කාර්ය ඉටුකිරීමට නොහැකිවන අවස්ථාවක දී, කොමිෂන් සභාව විසින් එම නොහැකි වීමේ දින සිට දින හතක් ඇතුළත ස්ථිර පත්කිරීමක් සිදු කරන තෙක් අධ්‍යක්ෂ ධුරයේ කාර්යයන් කරගෙන යෑම සඳහා කොමිෂන් සභාව විසින් සුදුසු යැයි තීරණය කරනු ලබන යම් වැඩපිළිවෙලක් සකස් කළ යුතු ය. එම වැඩපිළිවෙල සකස් කරන තෙක් විශ්ව විද්‍යාල ලේඛකාධිකාරීවරයා විසින් එම ධුරයේ එදිනෙදා කටයුතු අඛණ්ඩව සිදු කළ යුතු ය.".

(3) එහි 8 වන ඡේදයේ :-

(i) ඒ ඡේදය "8අ" ඡේදය ලෙස නැවත අංකනය කිරීමෙන් ;

(ii) නැවත අංකනය කරන ලද 8අ ඡේදයේ (5) වන අනුජේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් :-

"8ආ. (1) තෝරාගැනීමේ කමිටුවක් විසින් කරනු ලබන ඉදිරිපත් කිරීම් මත පදනම්ව කළමනාකරණ මණ්ඩලයේ නිර්දේශය මත විශ්ව විද්‍යාලයීය පාලක සභාව විසින් නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා පත් කරනු ලැබිය යුතු අතර ඔහු ආයතනයේ පූර්ණකාලීන නිලධරයකු විය යුතුය.

(2) නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා කලින් ධුරය අත්හැර ගියහොත් මිස හෝ (3) වන අනුඡේදය යටතේ ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස, පත් කරනු ලැබූ දින සිට ගණන් බලනු ලබන වසර තුනක කාල සීමාවක් ගතවීම හෝ හැට පස් විය සම්පූර්ණ වීම යන මෙයින් කලින් එළඹෙන දිනය තෙක් ධුරය දැරිය යුතු ය. කිසිදු තැනැත්තකු අනුක්‍රමික ධුරකාල දෙකකට වැඩි වාර ගණනක් නියෝජ්‍ය අධ්‍යක්ෂවරයකු ලෙස පත් කරනු නොලැබිය යුතු ය.

(3) දෝෂාරෝපණ යෝජනාවක් සම්මත කර ගැනීම සඳහා කැඳවනු ලැබූ කළමනාකරණ මණ්ඩලයේ විශේෂ රැස්වීමක දී එම කළමනාකරණ මණ්ඩලයේ මුළු සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් දෙකකට නොඅඩු සංඛ්‍යාවකගේ ඡන්දයෙන් සම්මත කරගනු ලබන දෝෂාරෝපණ යෝජනාවක් මත පාලක සභාව විසින් නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා ධුරයෙන් ඉවත් කරනු ලැබිය යුතු ය.

(4) නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා, කළමනාකරණ මණ්ඩලයේ නිලබලයෙන් පත්වන සාමාජිකයකු, එක් එක් අධ්‍යයන මණ්ඩලවල නිල බලයෙන් පත්වන සාමාජිකයකු මෙන්ම එක් එක් විශේෂඥ මණ්ඩලවල නිල බලයෙන් පත්වන සාමාජිකයකු විය යුතු ය. ඔහු එක් එක් ස්ථාවර කමිටුවල සහ කළමනාකරණ මණ්ඩලය විසින් පත් කරන ලද වෙනත් යම් කමිටුවල නිලබලයෙන් පත්වන සාමාජිකයකු ද විය යුතු ය.

(5) නියෝජ්‍ය අධ්‍යක්ෂවරයාගේ කාර්ය සහ කර්තව්‍යයන් අධ්‍යක්ෂවරයාගෙන් විමසා කළමනාකරණ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය යුතු අතර ඒ කාර්ය සහ කර්තව්‍යය අධ්‍යක්ෂවරයාගේ විධානය සහ පාලනය යටතේ ඉටු කරනු ලැබිය යුතු ය."

(4) 10 වන ඡේදය වෙනුවට පහත දැක්වෙන අලුත් ඡේදය ආදේශ කිරීමෙන් ;

"10. (මෙහි මින්මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) කළමනාකරණ මණ්ඩලය ආයතනයේ අධ්‍යයන සහ විධායක මණ්ඩලය විය යුතු අතර එය පහත දැක්වෙන තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය.

"(1) පහත දැක්වෙන නිලබලයෙන් පත්වන සාමාජිකයන් එනම් :-

(අ) අධ්‍යක්ෂවරයා ;

(ආ) නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා ;

ඇ) උසස් අධ්‍යාපන විෂයයභාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ එම ලේකම්වරයාගේ නාමිකයකු ;

(ඈ) සෞඛ්‍ය විෂයයභාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ එම ලේකම්වරයාගේ නාමිකයකු ;

(ඉ) මුදල් විෂයයභාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ එම ලේකම්වරයාගේ නාමිකයකු ;

(ඊ) (මෙහි මින්මතු "අධ්‍යක්ෂ - ජනරාල්වරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා ;

(උ) ආයතනයේ ආසන්නතම අවසාන අධ්‍යක්ෂවරයා ;

(ඌ) පනත යටතේ පිහිටුවා ඇති විශ්වවිද්‍යාලවල සියලු වෛද්‍ය, වෛද්‍ය විද්‍යා, වෛද්‍ය සහ ඊට අනුබද්ධ විද්‍යා, සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා, පීඨවල පීඨාධිපතිවරුන් ;

(එ) පනත යටතේ පිහිටුවා ඇති විශ්ව විද්‍යාලවල සියලු දන්ත වෛද්‍ය විද්‍යා පීඨවල පීඨාධිපතිවරුන් ;

(ඒ) වෛද්‍ය සේවා විෂයයභාර නියෝජ්‍ය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා ;

(ඔ) දන්ත වෛද්‍ය සේවා විෂයභාර නියෝජ්‍ය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා ;

(ඕ) අධ්‍යාපන, පුහුණු සහ පර්යේෂණ විෂයභාර නියෝජ්‍ය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා

(2) පහත දැක්වෙන අනෙකුත් සාමාජිකයන්, එනම් ඃ

(අ) පනත යටතේ පිහිටුවන ලද විශ්ව විද්‍යාලවල, වෛද්‍ය විද්‍යා, වෛද්‍ය සහ ඊට අනුබද්ධ විද්‍යා, සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨයන්හි, අධ්‍යයන අංශ ප්‍රධානීන් අතරින් ඒ එක් එක් පීඨයේ පීඨ මණ්ඩලය විසින් එක් පීඨයකින් එක් සාමාජිකයකු බැගින් වන ලෙස තෝරා පත් කරගනු ලැබූ සාමාජිකයන් ;

(ආ) පනත යටතේ පිහිටුවන ලද විශ්ව විද්‍යාලවල දන්ත වෛද්‍ය පීඨයන්හි, අධ්‍යයන අංශ ප්‍රධානීන් අතරින් ඒ එක් එක් පීඨයේ පීඨ මණ්ඩලය විසින් එක් පීඨයකින් එක් සාමාජිකයකු බැගින් වන සේ තෝරා පත් කරගනු ලැබූ සාමාජිකයන් ;

(ඇ) අධ්‍යාපන, වෘත්තීමය, නීති, විද්‍යාත්මක හෝ පරිපාලන ක්ෂේත්‍රයන්හි විශිෂ්ඨ සේවාවන් ඉටුකර ඇති තැනැත්තන් අතුරින් කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සාමාජිකයන් හත් දෙනෙකු ;

එසේ වුවද, එසේ පත් කරනු ලැබූ සාමාජිකයන් අතුරින් යටත් පිරිසෙයින් සාමාජිකයන් තිදෙනෙකු වෛද්‍ය වෘත්තියට අයත් සාමාජිකයන් විය යුතු ය.

(ඈ) පාලක සභාවේ සාමාජිකයන් අතුරින් විශ්වවිද්‍යාල පාලක සභාව විසින් යෝජනා කරනු ලබන සාමාජිකයන් දෙදෙනෙකු

(3) මණ්ඩලය විසින් නිශ්චිත කාර්යයක් සඳහා සහ නිශ්චිත කාලසීමාවක් සඳහා යම් තැනැත්තකු වැඩිපුර එක් කර ගත හැකිනමුත් එසේ වැඩිපුර එක් කර ගන්නා ලද කිසිදු තැනැත්තකුට ඡන්ද විමසීමක දී ඉදිරිපත් විමට හෝ යම් රැස්වීමක දී ඡන්දය දීමට හෝ අයිතියක් නොමැත්තේ ය.

(5) එහි 13 වන ඡේදයේ -

(i) ඒ ඡේදය 13(1) ඡේදය ලෙස නැවත අංකනය කිරීමෙන් ;

(ii) නැවත අංකනය කරන ලද (1) වන අනුඡේදයේ "ආයතනය විසින් අධ්‍යයන සභා ප්‍රතිෂ්ඨාපිත කළ යුතු ය." යන වචන වෙනුවට "මණ්ඩලය විසින් අධ්‍යයන සභාවක් හෝ විශේෂඥ අධ්‍යයන සභාවත් ප්‍රතිෂ්ඨාපිත කළ යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් ;

(iii) (ත) අයිතමයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් අයිතම එකතු කිරීමෙන් :-

"(ද) ව්‍යවච්ඡේදය ;
(න) මූලික හා වෛද්‍ය විද්‍යාව ;
(ප) ජෛව - වෛද්‍ය තොරතුරුවේදය ;
(බ) සායනික ඖෂධවේදය ;
(ම) දැඩි සත්කාරය ;
(ය) සෞඛ්‍ය අංශ ආපදා කළමනාකරණය ;
(අඅ) හදිසි අවස්ථා වෛද්‍ය විද්‍යාව ;
(අආ) යල්පිනු වෛද්‍ය විද්‍යාව ;
(අඇ) වෛද්‍ය අධ්‍යාපනය ;
(අඈ) දීලිර පිළිබඳ වෛද්‍ය විද්‍යාව ;
(අඉ) ධූලක වේදය පිළිබඳ වෛද්‍ය විද්‍යාව ;
(අඊ) වෛරස අධ්‍යයන පිළිබඳ වෛද්‍ය විද්‍යාව ;
(අඋ) අණුක වෛද්‍ය විද්‍යාව ;
(අඌ) බහුවිධ ශික්ෂණ අධ්‍යනය ;
(අඑ) කායික විද්‍යාව ;
(අඒ) ක්‍රීඩා වෛද්‍ය විද්‍යාව."

(iv) නැවත අංකනය කෙරූ (1) වන අනුඡේදයේ (අඒ) අයිතමයට ඉක්බිතිවම (2) වන සහ (3) වන අලුත් අනුඡේද එකතු කිරීමෙන් ;

"(2) යම් වලංගු හේතුවක් නිසා අධ්‍යයන සභාවට හෝ විශේෂඥ අධ්‍යයන සභාවට නියමිත සාමාජිකයන් සංඛ්‍යාව පත් කිරීමට නොහැකිවන අවස්ථාවක දී, එම පුරප්පාඩු සම්පූර්ණ කිරීමට සුදුසුකම්ලත් තැනැත්තන් පත්කිරීමට මණ්ඩලයට බලය ඇත්තේ ය.

(3) මණ්ඩලයේ සම්පූර්ණ සාමාජික සංඛ්‍යාවෙන් තුනෙක් දෙකකට නොඅඩු සංඛ්‍යාවකින් සමන්විත කරගත් දෝෂාරෝපණය පිළිබඳ වූ ඡන්දයක් මගින් අධ්‍යයන සභා හෝ විශේෂඥ සභා විසුරුවා හැරීමට මණ්ඩලයට බලය ඇත්තේ ය.

(6) එහි 14 වන ඡේදයේ -

(1) (1) වන. (2) වන. (3) වන සහ (3අ) අනුඡේද ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන අනුඡේද ආදේශ කිරීමෙන්-

"(1) ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාල එකක් හෝ ඊට වැඩි ගණනක් අධ්‍යයන අංශ පිහිටුවා ඇති විශේෂඥ ක්ෂේත්‍රයක් වෙනුවෙන් යම් අධ්‍යයන සභාවක් පිහිටුවා ඇතිකල්හි ඒ අධ්‍යයන සභාව පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත වන්නේ ය.

(අ) අධ්‍යක්ෂවරයා ;

(ආ) නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා ;

(ඇ) පනත යටතේ පිහිටුවන ලද විශ්ව විද්‍යාලවල වෛද්‍ය, වෛද්‍ය විද්‍යා, වෛද්‍ය සහ ඊට අනුබද්ධ විද්‍යා, සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා යන පීඨවල, පීඨාධිපති විසින් පිළිවෙලින් නම් කරන එක් එක් අධ්‍යයන අංශවල ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයකු, මහාචාර්යවරයකු (මූලාසන), මහාචාර්යවරයකු, සහාය මහාචාර්යවරයකු, අධ්‍යයන අංශ ප්‍රධානියකු හෝ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්වරයකු ;

(ඈ) (i) ක්ෂුද්‍ර ජීවි විද්‍යා විශේෂඥ ක්ෂේත්‍රයේ දී හැර, අධ්‍යක්ෂවරයා මුලසුන දරන රැස්වීමක දී පනත යටතේ පිහිටුවනු ලද විශ්ව විද්‍යාලවල වෛද්‍ය, වෛද්‍ය විද්‍යා, වෛද්‍ය සහ ඊට අනුබද්ධ විද්‍යා, සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා යන පීඨවල ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයන්, මහාචාර්යවරයන් (මූලාසන), මහාචාර්යවරයන්, සහාය මහාචාර්යවරයන්, අධ්‍යයන අංශ ප්‍රධානීන් සහ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයන් අතරින් තෝරාපත් කර ගන්නා ලද සාමාජිකයන් තිදෙනෙකු ;

(ii) ක්ෂුද්‍ර ජීවි විශේෂඥ ක්ෂේත්‍රය සම්බන්ධයෙන් :-

(අ) අදාළ අධ්‍යයන අංශයේ නිර්දේශය මත පිළිවෙලින් පීඨාපති විසින් නම් කරන මේ පනත යටතේ පිහිටුවන විශ්ව විද්‍යාලවල වෛද්‍ය, වෛද්‍ය විද්‍යා, වෛද්‍ය සහ ඊට අනුබද්ධ විද්‍යා, සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා යන පීඨවල එක් එක් පරපෝෂවේදී අංශවල ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයකු, මහාචාර්යවරයකු ( මූලාසන), මහාචාර්යවරයකු, සහාය මහාචාර්යවරයකු, අධ්‍යයන අංශ ප්‍රධානියකු හෝ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයකු ;

(ආ) පනත යටතේ පිහිටුවන ලද විශ්ව විද්‍යාලවල වෛද්‍ය, වෛද්‍ය විද්‍යා, වෛද්‍ය සහ ඊට අනුබද්ධ විද්‍යා, සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා යන පීඨවල පරපෝෂවේදය පිළිබඳ විශේෂඥ ක්ෂේත්‍රයේ ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයන්, මහාචාර්යවරයන් (මූලාසන), මහාචාර්යවරයන්, සහාය මහාචාර්යවරයන්, අධ්‍යයන අංශ ප්‍රධානීන් සහ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයන් අතුරින් තෝරාපත් කර ගන්නා ලද සාමාජිකයන් තිදෙනෙකු ;

(iii) ප්‍රජා වෛද්‍ය විද්‍යා විශේෂඥ ක්ෂේත්‍රය සම්බන්ධයෙන් පිළිවෙලින් පීඨාධිපතිවරයා විසින් නම් කරනු ලබන පනත යටතේ පිහිටුවන ලද විශ්ව විද්‍යාලවල එක් එක් දන්ත වෛද්‍ය පීඨවල ප්‍රජා දන්ත සෞඛ්‍ය අංශයේ ප්‍රජා දන්ත වේදය පිළිබඳ ඒකකයේ ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයකු, මහාචාර්වරයකු (මූලාසන), මහාචාර්යවරයකු, සහාය මහාචාර්යවරයකු, අධ්‍යයන අංශ ප්‍රධානියකු හෝ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයකු ;

(ඉ) (i) ප්‍රජා වෛද්‍ය විද්‍යාව, පවුල් වෛද්‍ය විද්‍යාව සහ සාමාන්‍ය වෛද්‍ය වෘත්තිය යන විශේෂඥ ක්ෂේත්‍රවල නියෝජිතයන් හැර ;

(අ) ප්‍රධාන පුහුණු මධ්‍යස්ථානයකින් නියෝජිතයන් තිදෙනකු ;

(ආ) පහත දැක්වෙන එක් එක් පුහුණු මධ්‍යස්ථාන වලින් එක් නියෝජිතයකු ;

(i) දකුණු කොළඹ ශික්ෂණ රෝහල ;
(ii) උතුරු කොළඹ ශික්ෂණ රෝහල ;
(iii) ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල ;
(iv) මහනුවර ශික්ෂණ රෝහල ;
(v) ගාල්ල ශික්ෂණ රෝහල ;
(vi) යාපනය ශික්ෂණ රෝහල ;
(vii) මඩකලපුව ශික්ෂණ රෝහල ; සහ
(viii) අනුරාධපුර ශික්ෂණ රෝහල.

(ii) ක්ෂුද්‍ර ජීවි විශේෂඥ ක්ෂේත්‍රය සම්බන්ධයෙන් මේ ඡේදයේ (1)ඉ(1) අනුඡේදය යටතේ අධ්‍යක්ෂ - ජනරාල්වරයා විසින් නම් කරනු ලබන නියෝජිතයන්ට අමතරව ශ්‍රී ලංකා ජාතික රෝහලෙන් නම් කරන ලද එක් අතිරේක නියෝජිතයකු සහ,

(අ) ජාතික ලිංගාශ්‍රිත රෝග සම්ප්‍රේෂණ සහ නතුකරගත් ප්‍රතිශක්ති ඌණතා සහලක්ෂණය (NSACP) මර්දන වැඩ සටහනින් නියෝජිතයකු ;

(ආ) ක්ෂය රෝග සහ හෘද රෝග පිළිබඳ ජාතික වැඩ සටහනින් (NPTCD) නියෝජිතයකු ;

(ඇ) ළමුන් සඳහා වන රිජ්වේ ආර්යා ළමා රෝහලේ නියෝජිතයකු ;

(ඈ) මහරගම පිළිකා ආයතනයේ නියෝජිතයකු ;

(iii) ප්‍රජා වෛද්‍ය විශේෂඥ ක්ෂේත්‍රය සම්බන්ධයෙන් පිළිගත් එක් එක් පුහුණු මධ්‍යස්ථානවලින් වාරිකව මාරුවීම මත පදනම්ව, අධ්‍යක්ෂ - ජනරාල්වරයා විසින් නම් කරනු ලබන නියෝජිතයන් දස දෙනකුට නොවැඩි සංඛ්‍යාවක් තෝරාගනු ලැබිය යුතු අතර එසේ නම් කරනු ලබන සාමාජිකයන්, ප්‍රජා වෛද්‍ය විද්‍යා අධ්‍යයන මණ්ඩලයේ නිර්දේශය මත මණ්ඩලය විසින් නිශ්චිතව දක්වනු ලබන යෝග්‍යතා නිර්ණායක සපුරාලනු ලැබිය යුතු ය.

(iv) පවුල් වෛද්‍ය විද්‍යාව සහ සාමාන්‍ය වෛද්‍ය වෘත්තීය විශේෂඥ ක්ෂේත්‍රය සම්බන්ධයෙන් :-

(අ) ආයතනයේ අධ්‍යක්ෂවරයා මුලසුන දරන යෝග්‍ය පුහුණුකරුවන් සියල්ලගේ රැස්වීමකින් තෝරාපත් කර ගනු ලබන වයස අවුරුදු හැට පහ (65) ට අඩු පුහුණු කිරීමේ ඒකකයේ පුහුණුකරුවන් නව දෙනෙකු ;

(ආ) දේශන පවත්වන සහ පවුල් වෛද්‍ය විද්‍යා පුහුණු කිරීමේ අධ්‍යයන කාර්යයන් සඳහා දායක වන ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයන්, මහාචාර්යවරයන් (මූලාසන), මහාචාර්යවරයන්, සහාය මහාචාර්යවරයන්, අධ්‍යයන අංශ ප්‍රධානීන් සහ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයන් අතුරින් අධ්‍යයන අංශයේ නිර්දේශය මත පීඨාධිපතිවරයා විසින් නම් කරනු ලබන පනත යටතේ පිහිටුවන ලද විශ්ව විද්‍යාලවල වෛද්‍ය හෝ වෛද්‍ය විද්‍යා, වෛද්‍ය සහ ඊට අනුබද්ධ විද්‍යා සහ සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා යන එක් එක් පීඨවලින් එක් සාමාජිකයකු බැගින් වන සේ තෝරා පත් කරගනු ලබන සාමාජිකයන් ;

(v) අධිකරණ වෛද්‍ය විද්‍යා විශේෂඥ ක්ෂේත්‍රය සම්බන්ධයෙන් අධ්‍යයන සභාවේ සාමාජිකයන් වීමට යෝග්‍ය වන විශේෂඥයන් විසින් සපුරාලිය යුතු මේ ඡේදයේ (3) වන අනුඡේදය යටතේ විශේෂඥයන් විසින් නියමකර ඇති නිර්ණායකයන් සපුරා ඇති, අධිකරණ වෛද්‍ය කාර්යාලවල, ආයතනවල, පුහුණු කිරීමේ මධ්‍යස්ථානවල සේවයේ නිරත වන විශේෂඥයන් අතරින් අධ්‍යක්ෂ -ජනරාල්වරයා විසින් නම් කරනු ලබන විශේෂඥයන් දස දෙනෙකු,

(vi) ප්‍රසව හා නාරි වෛද්‍ය විශේෂඥ ක්ෂේත්‍ර සම්බන්ධයෙන් වූ -

(අ) කොළඹ ද සොයිසා කාන්තා රෝහලේ ප්‍රසව හා නාරි වෙද්‍ය විශේෂඥ වෛද්‍යවරුන් අතරින් අධ්‍යක්ෂ - ජනරාල්වරයා විසින් නම් කරනු ලබන, පුහුණු ඒකක, එකක් හෝ දෙකක් සම්බන්ධයෙන් වන විට එක් නියෝජිතයකු ද, තුනක් හෝ හතරක් වන විට නියෝජිතයන් දෙදෙනකු ද හෝ පහක් හෝ හයක් වන විට නියෝජිතයන් තිදෙනෙකු ද ;

(ආ) කොළඹ කාසල් වීදිය කාන්තා රෝහලේ ප්‍රසව හා නාරි වෛද්‍ය විශේෂඥවරුන් අතරින් අධ්‍යක්ෂ - ජනරාල්වරයා විසින් නම් කරනු ලබන පුහුණු ඒකක, එකක් හෝ දෙකක් සම්බන්ධයෙන් වන විට එක් නියෝජිතයකු ද, තුනක් හෝ හතරක් සම්බන්ධයෙන් වන විට නියෝජිතයන් දෙදෙනකු ද හෝ පහක් හෝ හයක් වන විට නියෝජිතයන් තිදෙනෙකු ද ;

(vii) (1)(ඉ)(i)(ආ) අනුඡේදය යටතේ නිශ්චිතව දක්වා ඇති ගණනට අතිරිකව, ව්‍යාධි විද්‍යා විශේෂඥ ක්ෂේත්‍රය සම්බන්ධයෙන් මහරගම පිළිකා ආයතනයෙන් අධ්‍යක්ෂ - ජනරාල්වරයා විසින් නම් කරනු ලබන රක්ත ව්‍යාධිවේදී විශේෂඥ වෛද්‍යවරයකු ;

(ඊ) (i) (අ) එක් සාමාජිකයකු සෞඛ්‍ය අමාත්‍යාංශයේ සාමාජිකයකු වන්නා වූ ද; සහ

(ආ) එක් සාමාජිකයකු පනත යටතේ පිහිටුවනු ලැබූ විශ්ව විද්‍යාල කාර්ය මණ්ඩලයේ සාමාජිකයකු වන්නා වූ ද,

අදාල වෘත්තීය ආයතනයේ සභාපතිවරයා විසින් නම් කරනු ලබන පවුල් වෛද්‍ය විද්‍යාවේ පුහුණුකරුවන් නොවන්නා වූ පුහුණුකරුවන් වන සාමාජිකයන් දෙදෙනකු ;

(ii) පවුල් වෛද්‍ය විද්‍යාවේ සහ සාමාන්‍ය වෛද්‍ය වෘත්තියෙහි වෘත්තීය ආයතනය විසින් නම් කරනු ලබන පුහුණුකරුවන් වන්නා වූ සාමාජිකයන් දෙදෙනකු

(2) ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාලයක් විසින් අධ්‍යයන අංශයක් පිහිටුවා නොමැති විශේෂඥ ක්ෂේත්‍රයක් වෙනුවෙන් යම් අධ්‍යයන සභාවක් පිහිටුවා ඇති කල්හි, ඒ අධ්‍යයන සභාව (3) වන අනුඡේදයේ විධිවිධානවලට යටත්ව, පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය.

(අ) අධ්‍යක්ෂවරයා ;
(ආ) නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා ;
(ඇ) පනත යටතේ පිහිටුවනු ලැබූ විශ්ව විද්‍යාලවල එක් එක් වෛද්‍ය හෝ වෛද්‍ය විද්‍යා, වෛද්‍ය සහ ඊට අනුබද්ධ විද්‍යා සහ සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨවල ජ්‍යෙෂ්ඨ

මහාචාර්යවරයන්, මහාචාර්යවරයන්, සහාය මහාචාර්යවරයන් සහ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයන් අතුරින් එක් සාමාජිකයකු බැගින් වන සේ තෝරා පත් ගනු ලබන සාමාජිකයන් ;

(ඇ) (i) විකිරණවේදය, ව්‍යාධිවේදය, සායනික පිළිකාවේදය සහ වෛද්‍ය පරිපාලනය යන විශේෂඥ ක්ෂේත්‍රයන්ගෙන් හැර

(අ) ප්‍රධාන පුහුණු මධ්‍යස්ථානයේ නියෝජිතයන් තිදෙනෙකු ;

(ආ) පහත දැක්වෙන එක් එක් පුහුණු මධ්‍යස්ථානවලින් එක් එක් නියෝජිතයකු බැගින් එනම් :-

(i) දකුණු කොළඹ ශික්ෂණ රෝහල ;
(ii) උතුරු කොළඹ ශික්ෂණ රෝහල ;
(iii) ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල ;
(iv) මහනුවර ශික්ෂණ රෝහල ;
(v) ගාල්ල ශික්ෂණ රෝහල ;
(vi) යාපනය ශික්ෂණ රෝහල ;
(vii) මඩකලපුව ශික්ෂණ රෝහල ; සහ
(viii) අනුරාධපුර ශික්ෂණ රෝහල.

(ii) 2(ඇ)(i) අනුඡේදය යටතේ වූ නියෝජිතයන්ට අතිරේකව, විකිරණවේද විශේෂඥ ක්ෂේත්‍රයට අනුකූලව රිජ්වේ ආර්යා ළමා රෝහලේ අතිරේක නියෝජිතයකු

(iii) පහත දැක්වෙන ආකාරයට අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නම් කරනු ලබන සායනික පිළිකාවේද විශේෂඥ ක්ෂේත්‍රයට අනුකූල නියෝජිතයන් දොළොස්දෙනෙකු, එනම්.

(අ) යටත් පිරිසෙයින් තිදෙනකු ප්‍රධාන පුහුණු මධ්‍යස්ථානයෙන් එනම් මහරගම පිළිකා ආයතනය වැනි ආයතනයක් විය යුතු වූද (2)(ඇ)(i) අනුඡේදයේ සඳහන් පුහුණු මධ්‍යස්ථානවලින් නම් කරනු ලබන නියෝජිතයන් නව දෙනෙකු ;

(ආ) අනුරාධපුර සහ බදුල්ල මහ රෝහලෙන් එක් එක් නියෝජිතයකු වශයෙන් නම් කළ යුතු සායනික පිළිකාවේදය පිළිබඳ නියෝජිතයන් දෙදෙනකු ;

(ඇ) මණ්ඩලය විසින් නම් කළ යුතු පෞද්ගලික අංශයේ සායනික පිළිකා වෛද්‍ය විශේෂඥයකු

(iv) මෙම ඡේදයේ (1)(ඉ)(i) අනුඡේදයේ සඳහන් පුහුණු මධ්‍යස්ථානයන්ගෙන් අධ්‍යක්ෂ - ජනරාල්වරයා විසින් නම් කරනු ලබන කාම රෝගවේද විශේෂඥ ක්ෂේත්‍රයට අදාල නියෝජිතයන් නවදෙනෙකු, මේ අතුරින් අවම වශයෙන් තිදෙනකු පහත ආයතන වලින් විය යුතු ය.

(අ) මහරගම පිළිකා ආයතනයෙන් සහ

(ආ) (මින්මතු "STD ක්ලිනික්") යනුවෙන් හඳුන්වනු ලබන ලිංගාශ්‍රිත රෝග සම්ප්‍රේෂණ සම්බන්ධයෙන් වූ ප්‍රධාන සායනය ;

(v) අධ්‍යක්ෂ - ජනරාල්වරයා විසින් නම් කරනු ලබන රිජ්වේ ආර්යා ළමා රෝහලේ චර්මවේද විශේෂඥ ක්ෂේත්‍රය සම්බන්ධයෙන් වූ චර්ම රෝග විශේෂඥ වෛද්‍යවරයකු ;

(vi) පුහුණු ඒකක වලින් අධ්‍යක්ෂ - ජනරාල්වරයා විසින් නම් කරනු ලබන වෛද්‍ය පරිපාලන විශේෂඥ ක්ෂේත්‍රයට අදාල වූ නියෝජිතයන් නව දෙනෙකු.

(3) (අ) (1) වන සහ (2) වන අනුඡේදවල සඳහන් අධ්‍යයන සභාවේ සියලු සාමාජිකයන් පුහුණුකරුවන් විය යුතු ය. පුහුණුකරුවකු පනත යටතේ පිහිටුවා ඇති විශ්ව විද්‍යාල සහ සෞඛ්‍ය අමාත්‍යාංශය සම්බන්ධයෙන් වන විට ක්‍රියාකාරී සේවයේ යෙදී සිටින මණ්ඩල සහතිකය ලැබීමෙන් හෝ ඊට සමාන සුදුසුකම් ලබාගැනීමෙන් පසුව වසර තුනක පළපුරුද්දක් සහිත, සහ පවුල් වෛද්‍ය විද්‍යාව සහ සාමාන්‍ය වෛද්‍ය වෘත්තියෙහි යෙදී සිටිම සම්බන්ධයෙන් වන අවස්ථාවකදී, අදාළ අධ්‍යයන සභාවේ නිර්දේශ මත මණ්ඩලය විසින් තීරණය කරනු ලබන අදාල ක්ෂේත්‍රයේ යෙදී සිටින වයස අවුරුදු හැට පහට (65) අඩු තැනැත්තකු විය යුතු ය ;

(ආ) අධ්‍යයන සභාවක යම් අධ්‍යයන අංශ නාමිකයකු, අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් විමසා පනත යටතේ පිහිටුවා ඇති විශ්ව විද්‍යාලවල පීඨවල අදාළ පීඨාධිපතිවරුන් විසින් තෝරාගනු ලැබ එම තේරීම ආයතනයේ අධ්‍යක්ෂවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(ඇ) පුහුණු මධ්‍යස්ථානයකින් හෝ ඒකකයකින් විශේෂඥයකු තෝරාගනු ලැබිය යුතු අවස්ථාවක දී, මේ ඡේදයේ (3)(අ) අනුඡේදයේ නිශ්චිතව දක්වා ඇති අවශ්‍යතා සපුරාලනු ලබන විශේෂඥයන් සමගින් අදාල මධ්‍යස්ථානයේ හෝ ඒකකයේ අධ්‍යක්ෂවරයා හෝ ප්‍රධානියාගේ මූලසුන දරන රැස්වීමක් පවත්වනු ලැබිය යුතු ය. අධ්‍යක්ෂ - ජනරාල්වරයා විසින් හෝ අධ්‍යක්ෂ - ජනරාල්වරයා වෙනුවෙන් රෝහලේ අධ්‍යක්ෂ හෝ ආයතන ප්‍රධානියා විසින් තෝරාගනු ලබන එම විශේෂඥන්ගේ නම් ආයතනයේ අධ්‍යක්ෂවරයා වෙත දැනුම් දිය යුතු ය.

(3අ) දන්ත ශල්‍යවෛද්‍ය විශේෂඥ ක්ෂේත්‍රය සම්බන්ධයෙන් අධ්‍යයන සභාවක් පිහිටුවනු ලැබ ඇති අවස්ථාවකදී, එම අධ්‍යයන සභාව පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය.

(අ) අධ්‍යක්ෂවරයා ;

(ආ) නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා ;

(ඇ) පනත යටතේ පිහිටුවන ලද විශ්ව විද්‍යාලවල අදාළ අධ්‍යයන අංශවල නිර්දේශ සහිතව, දන්ත වෛද්‍ය විද්‍යා පීඨවල පීඨාධිපතිවරුන් විසින් නම් කරනු ලබන පහත දැක්වෙන පුහුණු ක්ෂේත්‍රවල ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයකු, මහාචාර්යවරයකු (මූලාසන), මහාචාර්යවරයකු, සහාය මහාචාර්යවරයකු, අධ්‍යයන අංශ ප්‍රධානී, හෝ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයකු

(i) මුඛ ශල්‍ය ;
(ii) මුඛ වෛද්‍ය ;
(iii) මුඛ ව්‍යාධිවේදය ;
(iv) පිළිසකර දන්තවේදය ;
(v) ප්‍රශ්ලේෂක දන්තවේදය ;
(vi) ප්‍රජා දන්ත සෞඛ්‍ය ;
(vii) දන්ත ඍජුකරණය ;
(viii) ළමා දන්තවේදය ;
(xi) දන්ත ව්‍යූහවේදය ;
(x) මූලික විද්‍යාවන්.

(ඈ) (1) සෞඛ්‍ය අමාත්‍යාංශයේ විශේෂඥ වෛද්‍යවරයන් අතුරින් අධ්‍යක්ෂ - ජනරාල්වරයා විසින් නම් කරනු ලබන විශේෂඥන් දස දෙනෙකු එනම් ;

(i) මුඛ සහ හකු ශල්‍ය වෛද්‍ය වේදය. දන්ත ඍජුකරණය සහ පිළිසකර දන්තවේදය යන විශේෂඥ අංශ නියෝජනය කරමින් දන්ත ආයතනයේ කොළඹ රෝහල් සමූහයෙන් පත් කරනු ලබන විශේෂඥයන් තිදෙනකු ;

(ii) මහරගම පිළිකා රෝහලෙන් එක් විශේෂඥයකු ;

(iii) ශික්ෂණ රෝහල්වලින් විශේෂඥයින් සිව්දෙනෙකු ;

(iv) මහරෝහල් හෝ මූලික රෝහල්වලින් විශේෂඥයන් දෙදෙනෙකු විය යුතු ය.

(ඉ) ශ්‍රී ලංකා දන්ත ව්‍යාධිවේදය සහ (Stomatology) මුඛදාන විද්‍යාලයේ පුහුණුකරුවන් වන සාමාජිකයන් තිදෙනෙකු ;

(ඊ) ශ්‍රී ලංකා පොදු දන්ත වෘත්තිකයන්ගේ විද්‍යාලයේ එක් සාමාජිකයකු ;

එසේ වුව ද, යම් විශ්ව විද්‍යාලයක් හෝ සෞඛ්‍ය අමාත්‍යාංශයේ යම් පුහුණු මධ්‍යස්ථානයක් නියෝජනය කරනු ලබන විශේෂඥ සාමාජිකයන් දන්ත ශල්‍ය වෛද්‍ය විද්‍යාව පිළිබඳ අධ්‍යයන සභාවේ සාමාජිකත්වය දැරීම සඳහා යෝග්‍යවීම ප්‍රකාරව ධුර දරනු ලබන තාක්කල් ධුර දරනු ලැබිය යුතු අතර එම සාමාජිකයා විශ්ව විද්‍යාලයෙන් හෝ මධ්‍යස්ථානයෙන් විශ්‍රාම යෑමේදී එම තැනැත්තාගේ සාමාජිකත්වය අවසන් වන්නේ ය.”

(2) (3අ) ඡේදයට ඉක්බිතිව (3ආ), (3ඇ) සහ (3ඈ) නව ඡේද ඇතුළත් කිරීමෙන් -

"(3ආ) මණ්ඩලය විසින් ක්‍රීඩා වෛද්‍ය විද්‍යා විශේෂඥ ක්ෂේත්‍රය සම්බන්ධයෙන් අධ්‍යයන සභාවක් පිහිටුවනු ලැබිය යුතු අතර එම අධ්‍යයන සභාව පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය.

(අ) අධ්‍යක්ෂවරයා ;

(ආ) නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා ;

(ඇ) ශ්‍රී ලංකා ක්‍රීඩා වෛද්‍ය විද්‍යා ආයතනයේ සාමාජිකත්වයෙන්, ශ්‍රී ලංකා ක්‍රීඩා වෛද්‍ය විද්‍යා ආයතනය විසින් නම් කරනු ලබන සාමාජිකයන් සිව් දෙනකු ;

(ඈ) ක්‍රීඩා විෂයභාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ක්‍රීඩා වෛද්‍ය විද්‍යා ඒකකයේ ප්‍රධානියා ;

(ඉ) විෂය දැනුම ඇති ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයන්, මහාචාර්යවරයන් (මූලාසන), මහාචාර්යවරයන්, සහාය මහාචාර්යවරයන් සහ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයන් අතරින් පනත යටතේ පිහිටුවා ඇති විශ්ව විද්‍යාලවල එක් එක් වෛද්‍ය, වෛද්‍ය විද්‍යා, වෛද්‍ය සහ ඊට අනුබද්ධ විද්‍යා, සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨයන්හි එක් එක් පීඨ මණ්ඩලය විසින් තෝරා ගනු ලබන හෝ තෝරා පත් කරගනු ලබන සාමාජිකයන් ;

(ඊ) පනත යටතේ පිහිටුවා ඇති විශ්ව විද්‍යාලවල දන්ත වෛද්‍ය පීඨයන්හි විෂය දැනුම ඇති එක් එක් පීඨයේ ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයන්, මහාචාර්යවරයන් (මූලාසන), මහාචාර්යවරයන්, සහාය මහාචාර්යවරයන් සහ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයන් අතරින් එම පීඨයේ එක් එක් පීඨ මණ්ඩලය විසින් තෝරාගනු ලබන හෝ තෝරාපත් කර ගනු ලබන සාමාජිකයන් ;

(උ) සෞඛ්‍ය අමාත්‍යාංශයේ ක්‍රීඩා විශේෂඥ වෛද්‍යවරයන් අතුරින් අධ්‍යක්ෂ - ජනරාල්වරයා විසින් නම් කරනු ලබන නියෝජිතයන් පස් දෙනෙකු ;

(ඌ) අධ්‍යාපන අමාත්‍යාංශයේ ශාරීරික අධ්‍යාපනය පිළිබඳ ප්‍රධානියා ; සහ

(එ) ක්‍රීඩා වෛද්‍ය විශේෂඥ ක්ෂේත්‍රයට අදාල ක්ෂේත්‍රවල උසස් සේවාවන් ඉටුකර ඇති නැතැත්තන් අතරින් කළමනාකරණ මණ්ඩලය විසින් නම් කරනු ලබන සාමාජිකයන් දෙදෙනෙකු ;

(ඒ) (3ඇ) මණ්ඩලය විසින් බහුවිධ පුහුණු අධ්‍යයන පාඨමාලා සඳහා අධ්‍යායන සභාවක් පිහිටුවනු ලැබිය යුතු- අතර එම අධ්‍යයන සභාව පහත දැක්වෙන තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය.

(අ) අධ්‍යක්ෂවරයා ;

(ආ) නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා ;

(ඇ) අදාල අධ්‍යයන සභාව විසින් නම් කරනු ලබන විශ්ව විද්‍යාලවල නිර්වින්දන, වෛද්‍ය, ළමා වෛද්‍ය, ශල්‍යකර්ම, ප්‍රසව හා නාරි වේදය පිළිබඳ අධ්‍යයන සභාවලින් එක් සාමාජිකයකු බැගින් ;

(ඈ) අදාල අධ්‍යයන සභාව විසින් නම් කරනු ලබන ශික්ෂණ රෝහල්වල පුහුණු ඒකක නියෝජනය කරමින් නිර්වින්දන, වෛද්‍ය, ළමා වෛද්‍ය, ශල්‍යකර්ම, ප්‍රසව හා නාරිවේදය පිළිබඳ අධ්‍යයන සභාවලින් එක් සාමාජිකයකු බැගින් ;

(ඉ) පනත යටතේ පිහිටුවන ලද විශ්ව විද්‍යාලවල, වෛද්‍ය, වෛද්‍ය විද්‍යා, වෛද්‍ය සහ ඊට අනුබද්ධ විද්‍යා, සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨයන්හි එක් එක් පීඨ මණ්ඩල විසින් තෝරා ගනු ලබන හෝ පත්කර ගනු ලබන නාමිකයන් ;

(ඊ) 15(3)(ඇ) ඡේදය ප්‍රකාවර සංස්ථාපනය කර ඇති අදාල විශේෂඥ සභාවේ සභාපතිවරයා ;

(උ) සෞඛ්‍ය ආශ්‍රිත රාජ්‍ය හෝ පෞද්ගලික අංශ ආයතනවල සේවය කරන හෝ සේවය කර ඇති ඉහළ කුසලතා සහිත ජ්‍යේෂ්ඨ අධ්‍යයන හෝ උපදේශක විශේෂඥ වෛද්‍යවරුන් අතරින් මණ්ඩලය විසින් නම් කරනු ලබන සාමාජිකයන් තිදෙනකු ;

(ඌ) යම් නිශ්චිත කාර්යයන් සඳහා බහුවිධ පුහුණු පාඨමාලා පිළිබඳ අධ්‍යයන සභාව විසින් නිර්දේශ කරනු ලබන ආකාරයට අධ්‍යයන පාඨමාලා හෝ පුහුණු වැඩසටහන්වල අවශ්‍යතාවය අනුව රඳාපවතිමින් අනුයුක්ත කරනු ලබන සාමාජිකයන්.

(3ඈ) මණ්ඩලය විසින් මූලික සහ වෛද්‍ය විද්‍යා පිළිබඳ අධ්‍යයන මණ්ඩලයක් පිහිටුවනු ලැබිය යුතු අතර එම අධ්‍යයන මණ්ඩලය පහත දැක්වෙන තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය.

(අ) අධ්‍යක්ෂවරයා ;
(ආ) නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා ;
(ඇ) පීඨයේ පීඨාධිපතිවරයා විසින් පිළිවෙලින් නම් කරනු ලබන විෂය දැනුම සහිත පනත යටතේ පිහිටුවනු ලබන විශ්ව විද්‍යාලවල වෛද්‍ය, වෛද්‍ය විද්‍යා, වෛද්‍ය සහ ඊට අනුබද්ධ විද්‍යා, සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨයන්හි ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයකු, මහාචාර්යවරයකු, සහාය මහාචාර්යවරයකු හෝ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයකු ;

(ඈ) පීඨයේ පීඨාධිපතිවරයා විසින් පිළිවෙලින් නම් කරනු ලබන්නා වූ පනත යටතේ පිහිටුවා ඇති එක් එක් වෛද්‍ය, වෛද්‍ය විද්‍යා, වෛද්‍ය සහ ඊට අනුබද්ධ විද්‍යා, සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා යන පීඨයන්හි අදාල අධ්‍යයන අංශයේ ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයකු, මහාචාර්යවරයකු (මූලාසන) මහාචාර්යවරයකු, සහාය මහාචාර්යවරයකු, අධ්‍යයන අංශ ප්‍රධානියකු, හෝ ජ්‍යේෂ්ඨ කථිකාචාර්යවරයකු ;

(ඉ) මේ ඡේදයේ (3ඇ)(ඇ) අනුඡේදය ප්‍රකාරව සංස්ථාපනය කරනු ලැබිය යුතු අදාල විශේෂඥ සභාවේ සභාපතිවරයා ;

(ඊ) විෂය දැනුම සහිත විශ්ව විද්‍යාල අධ්‍යයන අංශ නියෝජනය කරනු ලබන හෝ අදාල පුහුණු පාඨමාලා සහිත සෞඛ්‍ය ආශ්‍රිත ආයතන නියෝජනය කරනු ලබමින් මණ්ඩලය විසින් පත්කරනු ලබන සාමාජිකයන් තිදෙනකු ;

(උ) මූලික සහ වෛද්‍ය විද්‍යා විශේෂඥ ක්ෂේත්‍රයට අදාළ වෘත්තිය ආයතන, සංගම්, සමිති වලින් සාමාජිකයන් දෙදෙනකු බැගින්

(3) එහි (5) වන අනුඡේදය ඉවත්කර, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් ඃ

"(5)(අ) අධ්‍යයන සභාවේ යම් සාමාජිකයකු කලින් ධුරය හිස් කරනු ලබයි නම් මිස, ඔහුගේ තේරීමේ හෝ පත්කිරීමේ දින සිට ගණන් ලබනු ලබන වසර තුනක කාලයක් සඳහා ධුර දරනු ලැබිය යුතු අතර ඔහු නැවත තේරීම හෝ නැවත පත්කිරීම සඳහා යෝග්‍ය වන්නේ ය ;

එසේ වුව ද, යම් තෝරාගත් හෝ පත්කළ සාමාජිකයකු ස්වකීය ධුර කාලයට පෙර තමාගේ ධුරය හිස්කරනු ලබන අවස්ථාවකදී, ඔහුගේ අනුප්‍රාප්තිකයා තමා කලින් ධුරය හිස් කරන්නේ නම් මිස, තමාගේ පූර්වගාමියාගේ ඉතිරි ධුර කාලය සඳහා ධුර දරනු ලැබිය යුතු ය.

එසේම තවදුරටත්, යම් තෝරාගත් හෝ පත්කළ සාමාජිකයකු තමා මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් පත්වීම හෝ තේරීම සඳහා යෝග්‍යවීම ප්‍රකාරව යම් තත්වයක් හෝ සාමාජිකත්වය දරනු ලබන තාක්කල් ධුර දරනු ලැබිය යුතු අතර පුහුණු ඒකකයෙන්, මධ්‍යස්ථානයෙන්, විශ්ව විද්‍යාල පීඨයෙන් හෝ අධ්‍යයන අංශයෙන් ඉල්ලා අස්වීම, විශ්‍රාම යෑම හෝ මාරු කිරීම සිදුවීමේ දී එම සාමාජිකයා සාමාජිකයකු වීම අවසන් වන්නේ ය. පවුල් වෛද්‍ය විද්‍යාව සම්බන්ධයෙන් වන විට එම තැනැත්තා වයස අවුරුදු හැට පහ (65) සම්පූර්ණ කිරීමේදී සාමාජිකයකු වීම අවසන් වන්නේ ය.

(ආ) අධ්‍යක්ෂවරයා අමතන ලිපියක් මගින් යම් අධ්‍යයන සභා සාමාජිකයකු විසින් ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(ඇ) නොපැමිණීම සඳහා නිවාඩු නොමැතිව මණ්ඩලයේ අඛණ්ඩව රැස්වීම් තුනකට සහභාගිවීමට අපොහොසත්වන අධ්‍යයන සභාවේ යම් තෝරාගත් හෝ පත්කළ සාමාජිකයකු මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් වූ ස්වකීය ධුරය හිස්කරනු ලැබ ඇති ලෙස සලකනු ලැබිය යුතු අතර එසේ ඇතිවන පුරප්පාඩුව පිරවීම සඳහා සුදුසු පුද්ගලයකු පත්කිරීම සඳහා අධ්‍යක්ෂවරයා විසින් පියවර ගනු ලැබිය යුතු ය."

(4) එහි (7) වන අනුඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :

"(7) (අ) සෑම අධ්‍යයන සභාවක් සඳහාම ඊට අදාළ අධ්‍යයන සභාවේ නිර්දේශය මත මණ්ඩලය විසින් පත්කරනු ලබන අධ්‍යයන සභාවේ සාමාජිකයකු විය යුතු වූ ලේකම්වරයකු සිටිය යුත්තේ ය.

(ආ) ලේකම්වරයාගේ ධුර කාලය අධ්‍යයන සභාවේ ධුරකාලය වන්නේ ය."

(5) එහි (8) වන අනුඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්

"(8) (අ) (1) අනුඡේදය යතේ සංස්ථාපනය කරනු ලබන අධ්‍යයන සභාවේ රැස්වීමක සණපූරණය, යම් සම්බන්ධ කර ගත් සාමාජිකයන් ඇත්නම් ඔවුන් හැර, සිටින සමස්ත සාමාජිකත්වයෙන් හතරෙන් එකක් වන්නේ ය ;

(ආ) (2) වන අනුඡේදය යටතේ සංස්ථාපනය කරනු ලබන අධ්‍යයන සභාවේ රැස්වීමක සණපූරණය, යම් සම්බන්ධ කර ගත් සාමාජිකයන් ඇත්නම් ඔවුන් හැර, පසුව සිටින සමස්ත සාමාජිකත්වයෙන් හතරෙන් එකක් වන්නේ ය."

(7) එහි 15 වන ඡේදයෙහි-

(i) එහි (2) අනුඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් අනුඡේද ඇතුළත් කිරීමෙන් :-

"(3) මණ්ඩලයේ අනුමතය ඇතිව සහ අදාල අධ්‍යයන සභාවේ නිර්දේශය ලබා ගැනීමෙන් පසුව, ආයතනය විසින් පොදු හෝ උප - විශේෂඥ ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂඥ සභා පිහිටුවනු ලැබිය යුතු අතර -

(අ) වෛද්‍ය විශේෂඥ ක්ෂේත්‍ර සම්බන්ධයෙන් මණ්ඩලය විසින් ස්ථාපිත අදාල විශේෂඥ සභාවක පොදු විධානයන්ට යටත්ව ක්‍රියාත්මක කළ යුතු ය.

(ආ) යම් අදාල අධ්‍යයන සභාවක සාමාන්‍ය විධානය යටතේ උපදෙස්, අධ්‍යාපනය, පුහුණුව සහ ඇගයීම් සිදුකරනු ලබන යම් පොදු හෝ උප - විශේෂඥ ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂඥ සභාවක් පිහිටුවා ඇති අවස්ථාවක දී, එම විශේෂඥ සභාව පහත දැක්වෙන පරිදි නම් කළ සාමාජිකයන් දස දෙනෙකුගෙන් සමන්විත යුතු ය.

(i) අධ්‍යක්ෂවරයා ;

(ii) නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා ;

(iii) මණ්ඩලය විසින් අනුමත කරනු ලබන සහ අදාල අධ්‍යයන සභාව විසින් නම් කරනු ලබන අදාල ක්ෂේත්‍රයේ අවුරුදු පහකට වැඩි පශ්චාත් මණ්ඩල සහතික අත්දැකීම් සහිත විශේෂඥයන්ගේ පස් දෙනකුගෙන් සහ අදාල පශ්චාත් මණ්ඩල සහතික අත්දැකීම් සහිත විශේෂඥයන් තිදෙනකුගෙන් සමන්විත වන සාමාජිකයන් අටදෙනකු ;

එසේ වුව ද, ඉහත සඳහන් සාමාජිකයන් අටදෙනාගෙන්, සාමාජිකයන් හත්දෙනෙකු පනත යටතේ පිහිටුවා ඇති ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාලවල හෝ සෞඛ්‍ය අමාත්‍යාංශයේ හෝ සන්නද්ධ හමුදා හෝ සෞඛ්‍ය ආශ්‍රිත පොදු ආයතනවල දැනට සේවයේ නියුක්තව සිටින හෝ එසේ සේවයේ නියුක්තව සිටිනු ලැබ ඇති සාමාජිකයන් අතරින් නම් කරනු ලැබිය යුතු අතර එක් තැනැත්තකු සෞඛ්‍ය ආශ්‍රිත පෞද්ගලික අංශයේ ආයතනයකින් නම් කරනු ලැබිය යුතු ය.

(iv) සාමාජිකයන් දෙදෙනකු අදාල ක්ෂේත්‍රවල අවුරුදු පහකට වැඩි පශ්චාත් මණ්ඩල සහතික පළපුරුද්දක් සහිත විශේෂඥයන් අතරින් මණ්ඩලය විසින් නම් කරනු ලැබිය යුතු ය.

(ඈ) සෑම විශේෂඥ සභාවක් සඳහාම ස්වකීය සාමාජිකත්වය අතරින් එම විශේෂඥතා සභාවේ සාමාජිකයන් විසින් තෝරාපත්කරගනු ලැබිය යුතු සභාපතිවරයකු සහ ලේකම්වරයකු සිටිය යුතු ය ;

(ඈ) විශේෂඥ සභාවක රැස්වීමක් සඳහා වූ සණපූරණය, සම්බන්ධ කරගත් සාමාජිකයන් ඇත්නම් ඔවුන් හැර, සමස්ත සාමාජිකත්වයෙන් හතරෙන් එකක් වන්නේ ය ;

(ඉ) විශේෂඥ සභාවක ධුරකාලය අධ්‍යයන සභාවේ ධුර කාලය අවසන්වන දිනයේ දී අවසන් විය යුතු ය ;

(ඊ) එක් එක් විශේෂඥ සභාවක්ම එක් වසරක් සඳහා අවම වශයෙන් රැස්වීම් හයක් පවත්වනු ලැබිය යුතු ය ;

(උ) එක් එක් විශේෂඥ සභාවක් විසින්ම යම් නිශ්චිත කාර්යයක් සඳහා නිශ්චිත කාලපරිච්ඡේදයකට විශේෂඥයන් සම්බන්ධ කර ගැනීමට නිර්දේශ කරනු ලැබිය හැකි අතර එසේ සම්බන්ධ කර ගනු ලබන කිසිම තැනැත්තකුට ඡන්දයෙන් පත්වීම සඳහා ඉදිරිපත් වීමට හෝ එම විශේෂඥ සභාවේ රැස්වීමක දී ඡන්දය දීමට හෝ අයිතියක් නොතිබිය යුතු ය ; සහ

(ඌ) අදාල අධ්‍යයන සභාවත සාමාජිකයකු නොවන්නා වූ යම් විශේෂඥ සභාවක සාමාජිකයකුට අදාල අධ්‍යයන මණ්ඩල රැස්වීමකදී එම විශේෂඥ සභාවට අදාල කරුණු ඉදිරිපත් කිරීම පවරා ඇති අවස්ථාවක දී, එම නිශ්චිත කරුණු ඉදිරිපත් කිරීමේ කාර්ය සඳහා එම නාමිකයා යථාපරිදි සම්බන්ධ කර ගෙන ඇති ලෙස සලකනු ලැබිය යුතු අතර එම කරුණු ඉදිරිපත් කිරීම සම්පූර්ණ කිරීමෙන් පසුව එම තැනැත්තා සම්බන්ධිත සාමාජිකයකු වීම අවසන් වන්නේ ය.

(4) මේ පනතේ, නියමාවලියේ හෝ වෙනත් යම් උචිත සාධන පත්‍රයක විධිවිධානවලට සහ අධ්‍යයන සභාවේ පොදු විධාන සහ පාලනයට යටත්ව, එක් එක් විශේෂඥ සභාවක්ම පහත දැක්වෙන කාර්ය ඉටුකිරීම සහ ක්‍රියාත්මක කිරීම කරනු ලැබිය යුතු ය.

(අ) පොදු හෝ උප විශේෂඥතාවයකට අදාළ අධ්‍යයන පාඨමාලා, පුහුණු වැඩ සටහන්, විෂයමාලා සහ විභාගවලට සම්බන්ධිත සියලු කරුණු පිළිබඳව අදාල අධ්‍යයන සභාව වෙත නිර්දේශ ඉදිරිපත් කර වාර්තා කිරීම ;

(ආ) විශේෂඥ ක්ෂේත්‍රයට සම්බන්ධ විශේෂ විෂයක් ඇත්නම් ඒ පිළිබඳ සලකා බලා වාර්තා කිරීමේ කාර්ය සඳහා විශේෂඥ සභාවේ සාමාජිකයන් නොවන්නා වූ තැනැත්තන් ඇතුළත් වන උප කමිටු පත් කිරීම සඳහා අදාල අවස්ථාවලදී නිර්දේශ කිරීම ;

(ඇ) අධ්‍යයන පාඨමාලා, පුහුණු වැඩ සටහන් සහ විභාග සඳහා පුහුණුවන්නන් ඇතුළත් කර ගැනීම සඳහා වූ අවශ්‍යතා අධ්‍යයන සභාව වෙත නිර්දේශ කිරීම ;

(ඈ) අධ්‍යයන පාඨමාලා සහ විභාගවලට අදාල නියෝගවල කෙටුම්පත් අධ්‍යයන සභාව වෙත භාරදීම ;

(ඉ) ගුරුවරුන් හා පරීක්ෂකවරුන්ගේ කර්තව්‍ය පාලනය කරනු ලබන පොදු රීති හා නියෝගවලට එකඟව, ගුරුවරුන් සහ විභාග පරීක්ෂකවරුන් වශයෙන් හඳුනාගත යුතු සුදුසු පුද්ගලයන් පිළිබඳව අධ්‍යයන සභාවට නිර්දේශ ඉදිරිපත් කිරීම ;

(ඊ) අදාල අධ්‍යයන සභාව විසින් හෝ මණ්ඩලය විසින් විශේෂඥ සභාව වෙත යොමු කරනු ලබන කරුණු පිළිබඳ වාර්තා කිරීම."

(8) එහි 25 වන ඡේදයෙහි

(i) "වෛද්‍ය විද්‍යාවේ විශේෂ ක්ෂේත්‍රය" යන අර්ථ නිරූපණය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්

"වෛද්‍ය විද්‍යාවේ විශේෂඥ ක්ෂේත්‍රය" යන්නෙන් නිර්වින්දන වේදය, කායච්ඡේදනය, මූලික සහ වෛද්‍ය විද්‍යාව, ජීව - වෛද්‍ය තොරතුරු වේදය, සායනික පිළිකා, සායනික ඖෂධ වේදය, ප්‍රජා වෛද්‍ය විද්‍යාව, දැඩි සත්කාර, දන්ත ශල්‍ය වෛද්‍ය වේදය, චර්ම වේදය, සෞඛ්‍ය අංශයේ ආපදා

කළමනාකරණය, හදිසි වෛද්‍ය වේදය, පවුල් වෛද්‍ය විද්‍යාව සහ සාමාන්‍ය වෛද්‍ය වෘත්තිය, අධිකරණ වෛද්‍ය විද්‍යාව, යල්පීනු වෛද්‍ය විද්‍යාව, සෞඛ්‍ය විද්‍යාව, වෛද්‍ය විද්‍යාව, වෛද්‍ය පරිපාලනය, වෛද්‍ය අධ්‍යාපනය, වෛද්‍ය දිලීර විද්‍යාව, වෛද්‍ය ධූලකවේදය, වෛද්‍ය වෛරස වේදය, ක්ෂුද්‍ර ජීවී විද්‍යාව, අනුක විද්‍යාව, බහුවිධ ශික්ෂණ අධ්‍යයනයන්, ප්‍රසව හා නාරිවේදය, අක්ෂිවේදය, කණ, නාසය සහ උගුර පිළිබඳ වෛද්‍ය වේදය, ළමා රෝග වේදය, පරපෝෂවේදය, ව්‍යාධි විද්‍යාව, මනෝ විද්‍යාව, මනෝචිකිත්සාව, විකිරණවේදය, ක්‍රීඩා වෛද්‍ය විද්‍යාව, ශල්‍යකර්ම වේදය, කාම ව්‍යාධි වේදය හෝ ආයතනයේ හා විශ්ව විද්‍යාලයේ නිර්දේශ මත කලින් කල කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන වෙනත් යම් විශේෂඥ ක්ෂේත්‍රයක් අදහස් වේ.

"ප්‍රධාන පුහුණු මධ්‍යස්ථානය" යන්නෙන් පවත්නා සාමාජිකයන් වෙත සාධාරණ නිවේදනයක් සහිතව එහෙත් යම් අධ්‍යයන සභාවක පවත්නා සාමාජිකත්වයට අගතියක් නොමැතිව අදාල අධ්‍යයන සභාවේ නිර්දේශය මත මණ්ඩලය විසින් නිශ්චිතව දක්වනු ලබන යම් විශේෂඥ ක්ෂේත්‍රයක් පිළිබඳ උපදෙස් හෝ පුහුණුව සපයනු ලබන ප්‍රමුඛ පුහුණු ඒකකයක් හෝ මධ්‍යස්ථානයක් වශයෙන් නම් කර ඇති පුහුණු මධ්‍යස්ථානයක් අදහස් වේ.

08-550

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.